# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
# DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத் திறைசேரி, நிதி, திட்டமிடல் அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance and Planning, Colombo 01, Sri Lanka.

**Web Site** : www.treasury.gov.lk **e-mail** : budget@nbd.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/CBP/1/1/2013-Sup. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2013.02.22 |

අයවැය චක්‍රලේඛ - 158

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**නව අමාත්‍යාංශ සඳහා වැය ශීර්ෂයන් හා කාර්යභාරයන් අනුව ප්‍රතිපාදන වෙන්කිරීම හා ගණන් තැබීම.**

2013.02.06 දිනැති අංක 1796/10 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුකූලව ස්ථාපිත කරන ලද නව අමාත්‍යාංශ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සළසාදීමට මෙම චක්‍රලේඛය මගින් දක්වා ඇති පරිදි කටයුතු කරනු ලැබේ.

02. 2013 වර්ෂය සඳහා වූ 2012 අංක 23 දරණ විසර්ජන පනත යටතේ ප්‍රතිපාදන සලසා නොමැති ඉහත අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන්, නව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වැය ශීර්ෂ මෙම චක්‍රලේඛයෙන් වෙන්කර දී ඇති අතර, එම විස්තරය මේ සමග යාකර ඇති පළමුවන උපලේඛනයේ 4 වන තීරුවේ දක්වා ඇත. තවද, නව අමාත්‍යාංශ සංශෝධන යටතේ වෙනසක් වී ඇති වැය විෂයයන් පමණක්, එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන ඉහත විසර්ජන පනත මගින් ලබා දී ඇති අමාත්‍යාංශය, එම වැය විෂයයන් ඉහත සංශෝධනය යටතේ ඇතුලත් නව අමාත්‍යාංශ මෙහි දක්වා ඇත.

03. නව අමාත්‍යාංශ සඳහා වැය ශීර්ෂ අංකයන් ලබාදීමේ දී පෙර පැවති අමාත්‍යාංශයන්හි විෂයයන්ට වඩාත් අනුකූල වන පරිදි වැය ශීර්ෂ ලබා දී ඇත. එහි නව අමාත්‍යාංශ සඳහා කලින් පැවති දෙපාර්තමේන්තු එකතු කළද එම දෙපාර්තමේන්තුවල වැය ශීර්ෂ අංක හා විෂයයන් නොවෙනස්ව පවතින බැවින්, දෙපාර්තමේන්තුවල ගිණුම් තැබීම, පැවති වැය ශීර්ෂ අංක අනුවම සිදු කළයුතුය. එසේම, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වනුයේ එය දැනට අනුයුක්ත කර ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා ය.

04. 2013.02.06 දිනට පෙර පැවති අමාත්‍යාංශ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් සහ එම අමාත්‍යාංශ යටතේ භාණ්ඩාගාර ලෙජරයේ පවත්වාගෙන ගිය අග්‍රිම ගිණුම්, තැන්පත් ගිණුම්, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් හා වෙනත් අත්තිකාරම් ගිණුම්වල නිරවුල් නොකළ ශේෂ පිළිබඳව කටයුතු කිරීමේ වගකීම ද මේ අයුරින්ම අදාල නව අමාත්‍යාංශ වෙත පැවරෙනු ඇත.

05. අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ප්‍රතිපාදන වෙන් කර ඇති අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල වියදම් ගිණුම්ගත කිරීම සඳහා මු.රෙ. 487 උපදෙස්වලට අනුකූලව අවිනිශ්චිත අවස්ථා අරමුදල් පොදු තැන්පත් ගිණුමක් ආරම්භ කළයුතු ය. ඒ සඳහා වන පොදු තැන්පත් ගිණුම් අංකය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු ය.


| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 0094-11-2484665<br>0094-11-2484639 *(Fax)* | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 0094-11-2484669<br>0094-11-2484853 | ෆැක්ස් අංකය<br>தொலைநகல் இல.<br>Fax No. | 0094-11-2484807 |

06. නව අමාත්‍යාංශ සැකැස්ම යටතේ හඳුනා නොගත් යම් නිශ්චිත ව්‍යාපෘතියක් හෝ කාර්යයක් වුවහොත්, එවැනි ව්‍යාපෘති හෝ කාර්යයන් සඳහා ප්‍රතිපාදන සලසාදීම සලකා බැලීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන මෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

07. මෙම චක්‍රලේඛය අනුව ක්‍රියාකිරීමේ දී කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වුවහොත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඒ.කේ. සෙනෙවිරත්න මහතා (දුරකථන අංක - 0112-484681) හෝ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ.පී. කුරුම්බලපිටිය මහතා (දුරකථන අංක - 0112-484753) විමසිය හැකි බව කාරුණිකව දන්වමි.

ජේ.ඩී.සී. ඒකනායක මෙය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

# නව අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සඳහා වෙන්කරන ලද අයවැය ප්‍රතිපාදන

| 2013 අයවැය ඇස්තමේන්තුවට අනුව වියදම් දැරිය යුතු ආයතන | | | නව වියදම් දරණ ආයතන | |
|---|---|---|---|---|
| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශයේ නම | මු.රෙ. 208 අනුකූලව නව වියදම් දරණ ආයතන සඳහා මාරු කරනු ලබන වැය විෂයයන් | වැය ශීර්ෂ අංකය | නව අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුවේ නම |
| 1 | 2 | 3 | 4 | 5 |
| 119 | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය<br>119-1-2-1-1503<br>119-1-2-1-2201<br>119-1-2-13-2302 (12)<br>119-1-2-13-2302 (13)<br>119-1-2-13-2302 (17)<br>119-1-2-14-2302 (17)<br>119-1-2-15-2502 (13) | 160 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| | | පරමාණුක බලශක්ති අධිකාරිය<br>119-1-2-9-1503<br>119-1-2-9-2201<br>පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම<br>119-1-2-10-2201 | 133 | තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යාංශය |
| 179 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 179-1-1<br>179-1-2<br>284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 179 | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය |
| | | 281- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>179-2-3-1001 (ප්‍රතිපාදන වලින් 24% )<br>1 9-2-3-1003 (ප්‍රතිපාදන වලින් 44% )<br>179-2-3 (100% අනෙකුත් සියළුම වැය විෂයයන්ගෙන්) | 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| | | 179-2-4 (ප්‍රතිපාදන 100% )<br>179-2-3-1001 (ප්‍රතිපාදන වලින් 76% )<br>179-2-3-1003 (ප්‍රතිපාදන වලින් 56% ) | 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 294- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව<br>322- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 188* | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය[1] |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | අමාත්‍ය කාර්යාලය<br>126-1-1 (ප්‍රතිපාදන වලින් 45% )<br>ද්‍රව්‍යසාධන වැඩසටහන්<br>126-2-6-4-1501 } (ප්‍රතිපාදන 100% )<br>126-2-6-6-1501<br>126-1-2-1001 (ප්‍රතිපාදන වලින් 4% )<br>126-1-2-1003 (ප්‍රතිපාදන වලින් 3% )<br>ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>126-2-9-3-1503 } (ප්‍රතිපාදන 100%)<br>126-2-9-3-2201 | 189* | අධ්‍යාපන සේවා අමාත්‍යාංශය [1] |
| | | | 187* | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය[1] |
| | | | 186* | සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය[1] |
| 102 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 102-1-2 (අමාත්‍යාංශ පරිපාලනය)<br>1001,1002,1003,1201, 1202,1301,1302,1303,1402,1506 යන වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන වලින් 3%<br>1101,1102,1405 යන වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන වලින් 1%<br>2102,2401 යන වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන වලින් 10% | 329* | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |

[1] අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවිනිශ්චිත අවස්ථා අරමුදල යටතේ, සලසා දෙනු ලැබේ

* නව අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සඳහා වෙන් කරනු ලබන වැය ශීර්ෂ